වයඹ පළාත් සභා පාසල්වල පුරප්පාඩු සඳහා විදුහල්පති ශ්‍රේණිධාරින් ස්ථානගත කිරීමේ පරිපාටිය.

වයඹ පළාතේ පාසල් පද්ධතිය තුළ වඩාත් ගුණාත්මක අධ්‍යාපන ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා, පද්ධතිය තුළ ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරන විදුහල්පතිවරුන්ට වඩාත් සුදුසු පාසලක් ලබා දීමත් ඒ ඒ පාසල් සඳහා වඩාත්ම සුදුසු විදුහල්පතිවරයා පත් කිරීම තුළින් පාසල් පද්ධතිය වඩාත් කාර්යක්ෂම කිරීමත් අරමුණු කරගනිමින් මෙම පටිපාටිය සකස් කර ඇත.

ඉහත මූලික අරමුණු ඉටු කර ගැනීම පිණිස වයඹ පළාත් සභාවට අයත් පාසල්වල විදුහල්පති තනතුරුවල ඇතිවන පුරප්පාඩු සඳහා විදුහල්පති ශ්‍රේණිධාරින් ස්ථානගත කිරීමේදී පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු වේ.

ක්‍රියාත්මක වන දිනය : මෙම පටිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

1. **පුරප්පාඩු ගණනය කිරීම.**

   1.1. ඒ ඒ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් තම කලාප වල ඉදිරි මාස 3ක කාලය තුළ විදුහල්පති ශ්‍රේණිධාරින්ගේ විශ්‍රාම යාම මත අදාළ විදුහල්පති තනතුර පුරප්පාඩු වන පාසල් ලේඛනය සෑම මසකම 05 වන දිනට පෙර වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ටද පිටපතක් සහිතව වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතු අතර ඒ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන ලේකම් වෙත ලබා දිය යුතුයි.

   1.2. විශ්‍රාම යාම මත ඇතිවන පුරප්පාඩු වලට අමතරව මිය යාම, වෙනත් පළාත් සඳහා ස්ථාන මාරු වී යාම හෝ එවැනි වෙනත් හදිසි හේතු මත ඇතිවන පුරප්පාඩු , එම පුරප්පාඩුව ඇති වූ විගස අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ට ද පිටපතක් සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කළ යුතුයි.

2. **පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීම.**

   ඒ ඒ මාසයේ 15 වන දිනට පෙර පුරප්පාඩු සහිත පාසල් ලේඛනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන ලේකම්ටද පිටපතක් සහිතව සියලුම විදුහල්පතිවරුන් දැනුවත් වන ආකාරයට කලාප අධ්‍යක්ෂවරුන් හා කොට්ඨාස අධ්‍යක්ෂවරුන් මඟින් ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවීම සිදු කළ යුතුය.මෙම පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීම වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන http://cm.nw.gov.lk වෙබ් අඩවියේ සහ වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන www.nwpedu.lk වෙබ් අඩවිය ඔස්සේද ඒ ඒ කලාප වල නිල විදුහල්පති WhatsApp සමූහ වලද මෙම අයදුම්පත් කැඳවීමට අදාළ නිවේදනය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබේ.

3. **අයදුම් කිරීම.**

   3.1 . අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු මූලික සුදුසුකම්

   01. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I / II/ III ශ්‍රේණියක නිලධාරියෙකු විය යුතුය.

   02. අයදුම් කර ඇති තනතුර පුරප්පාඩු වන දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුල විනය ක්‍රියාමාර්ගයකට භාජනය වී නොතිබිය යුතුය.

   03. අයදුම්කර ඇති තනතුර පුරප්පාඩු වන දිනට වයස අවු.58 ට නොවැඩි විය යුතුය.

   04. දැනට දරණ විදුහල්පති සේවයේ තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මඟින් පත් කර ඇත්නම් එම තනතුරේ රාජකාරී භාරගත් දින සිට වසර තුනක (03) සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

වයඹ පළාත් සභාව
වයඹ පළාත්
දරණ
වයඹ ආණ්ඩුකාරවරිය ලේකම්
දිනය: 2026/05/06

3.2 . අයදුම් කිරීමේ ක්‍රමවේදය

පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමේ නිවේදනයේ සඳහන් පරිදි අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර සියලුම අයදුම්පත්‍ර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්කරුවන් විසින් භාර දිය යුතුයි.

අයදුම්පත්‍රය මෙහි ඇමුණුම 1 හි සඳහන් අයදුම්පත්‍රය විය යුතුයි.

04.පත් කිරීමේ ක්‍රමවේදය

කාරණය	කාල සීමාව	වගකීම
පුරප්පාඩු පාසල් සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීම	පුරප්පාඩු ප්‍රසිද්ධ කර සති 3ක් ඇතුළත	අයදුම්කරුවන්
කලාප අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම.	අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනෙන් පසු වැඩකරන දින 7ක් ඇතුලත	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන ලේකම් වෙත අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම.	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ ලැබීමෙන් පසු වැඩකරන දින 7ක් ඇතුලත	පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.	පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ ලැබීමෙන් පසු සති දෙකක් ඇතුලත	පළාත් අධ්‍යාපන ලේකම්
පුරප්පාඩු සහිත පාසල් සඳහා සුදුසු විදුහල්පතිවරුන් පත්කිරීම.	සම්මුඛ පරීක්ෂණය පවත්වා සති දෙකක් ඇතුළත	පළාත් අධ්‍යාපන ලේකම්

05.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය:

5.1 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කිරීමේ බලධාරියා:

වයඹ පළාත් අධ්‍යාපන ලේකම්.

5.2 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය:

1. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සභාපති)
2. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සාමාජික)
3. අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක (සාමාජික)

වයඹ පළාත් සභාවේ
අංකය ..... දිනය
ඉහත සඳහන් සභා තීරණය
අනුව පහත සඳහන්
සාමාජිකයින් ගැනීමට
කටයුතු කරන ලෙස
කරු ... මහ ලේකම්
2026/5/6 දින මගින් කරන ලද
බව සහතික කරමි.
වයඹ පළාත් සභාවේ ලේකම්
දිනය: 2026/5/6

සටහන - 1

ඉහත 1 හා 2 තනතුරු පුරප්පාඩු වී ඇති අවස්ථාවක හෝ, අදාළ තනතුර දරන්නා තනතුරෙහි නොමැති අවස්ථාවක පළාත් අධ්‍යාපන ලේකම් විසින් ඒ සඳහා නිලධාරියෙකු අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා පත් කරනු ලැබේ.

06.ලකුණු ලබාදීමේ ක්‍රමවේදය:

පහත සඳහන් ක්‍රමවේදයට අනුව ලකුණු ලබා දීම සිදු කළ යුතුයි.

(06.1) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්. (උපරිම ලකුණු 15)

(අ) සහ (ආ) යටතේ ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.මෙකිදී, අදාළ සුදුසුකම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් සහතිකයක් මඟින් සනාථ කල යුතුය.

(අ). අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 08)

අනු අංකය	අධ්‍යාපන සුදුසුකම්	ලකුණු
01	අධ්‍යාපනපති නොවන පශ්චාත් උපාධියකට ඉහළ අධ්‍යාපන සුදුසුකමක් සඳහා	08
02	අධ්‍යාපනපති උපාධිය හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමක් සඳහා	07
03	අධ්‍යාපනපති උපාධිය නොවන වෙනත් පශ්චාත් උපාධියක් සඳහා	06
04	ප්‍රථම උපාධිය සඳහා	05
05	වෘත්තීය සුදුසුකමක් නොවන වෙනත් අධ්‍යාපන ඩිප්ලෝමාවක් සඳහා	04
06	අ.පො.ස (උ.පෙළ) සමත් වීම (අවම වශයෙන් විෂයයන් 3 ක් සමත් වීම)	03
07	අ.පො.ස (සා පෙළ) සමත් වීම (ගණිතය, මව්බස යන විෂයයන් සහිතව විෂයයන් 6ක් සමඟ සම්මාන 3ක් ලබා සමත්වීම මෙහිදී සලකා බලනු ලැබේ.)	02

(ආ). වෘත්තීය සුදුසුකම් (උපරිම ලකුණු 05)

අනු අංකය	වෘත්තීය සුදුසුකම්	ලකුණු
01	පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා /පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා	05
02	පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව	04
03	ගුරු පුහුණුව/ අධ්‍යාපන විද්‍යාපීඨ සහතික	03
04	වෙනත් අදාළ මාස තුනකට වැඩි සහතික පත්‍ර පාඨමාලා	02

සටහන 2:- අධ්‍යාපනවේදී උපාධිය හදාරා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රථම උපාධියට හිමි ලකුණු 05 ට අමතරව වෘත්තීය සුදුසුකම් යටතේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා හිමි ලකුණු 05 ද හිමිවේ.

(ඇ). දේශීය හෝ විදේශීය වෙනත් පුහුණු (දින 5ක් /පැය 40 හෝ ඊට වැඩි) (උපරිම ලකුණු 02)

විදුහල්පති සේවයට පත්වීමෙන් අනතුරුව සේවා කාලය තුල ලබා ඇති පුහුණු මේ සඳහා සලකා බලනු ලැබේ. එහිදී සේවා ව්‍යවස්ථාවේ සේවා අවශ්‍යතාවයක් ලෙස සඳහන් නොවන පුහුණු පාඨමාලා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

අනු අංකය	දේශීය හෝ විදේශීය වෙනත් පුහුණු	ලකුණු
01	දින 03 ක් /පැය 24 ක් හෝ ඊට වැඩි පුහුණු	01
02	දින 05 ක් /පැය 40 ක් හෝ ඊට වැඩි පුහුණු	02

(06.2) පාසලේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ලබාදී ඇති දායකත්වය. (විභාග ප්‍රතිඵල සඳහා ලකුණු 24 ක් හා අතිරේක ලකුණු 06 ක් ලෙස උපරිම ලකුණු 30)

විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ලකුණු ලබා දීමේ දී පූර්වාසන්න වසර 3 ක විභාග ප්‍රතිඵල ඇගයීම සඳහා භාජනය කෙරේ.වසර 3හි ප්‍රතිඵල වල සමත් ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය සලකා ලකුණු ලබාදීම සිදුකරනු ලැබේ.

(අ).5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය (උපරිම ලකුණු 08)

මෙම එක් එක් ලකුණු සීමාවේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පාසලේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 50% ඉක්මවයි නම් පමණක් අදාළ ලකුණු ප්‍රමාණය පිරිනැමිය යුතුයි.

ශිෂ්‍යත්ව විභාගයේ දී ලබා ගන්නා ලකුණු

ලකුණු 130 ටවැඩි	-	ලකුණු 08
ලකුණු 100 ට වැඩි	-	ලකුණු 06
ලකුණු 70 ට වැඩි	-	ලකුණු 04

(ආ). අ.පො.ස. (සා.පෙළ) විභාගය.(උපරිම ලකුණු 08)

ගණිතය, මව්බස යන විෂයයන් සහිතව විෂයයන් 6ක් සමග සම්මාන 3ක් ලබා සමත් වීමේ ප්‍රතිශතය මෙහිදී සලකා බලනු ලැබේ.

70% ට ඉහළ	-	ලකුණු 08
60% - 69% අතර	-	ලකුණු 06
50% - 59% අතර	-	ලකුණු 04
40 %- 49% අතර	-	ලකුණු 02

(ඇ). අ.පො.ස (උ.පෙළ) විභාගය (උපරිම ලකුණු 08)

එක් එක් විෂය ධාරාවෙහි වසර 3 හිම සමත් ප්‍රතිශතයෙහි සාමාන්‍ය අගය සැලකිය යුතුයි.

80%ට ඉහළ	-	ලකුණු 08
60% - 79% අතර	-	ලකුණු 06
50% - 59% අතර	-	ලකුණු 04
40 %- 49% අතර	-	ලකුණු 02



සටහන 3 :-ඉහත විභාග ප්‍රතිඵල සඳහා ලකුණු ගණනය කිරීම පහත පරිදි වේ.

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පමණක් පවත්වන පාසල් සඳහා - ලබාගත් ලකුණුx 3

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස (සා.පෙළ) විභාගය
හෝ
අ.පො.ස (සා.පෙළ) විභාගය හා අ.පො.ස (උ.පෙළ) විභාගය
පවත්වන පාසල් සඳහා
} (ලබාගත් ලකුණු x 3/2) +03

(අදාළ කාලසීමාව තුළ විදුහලේ විදුහල්පති තනතුරේ සේවය කර ඇත්නම් පමණක් අතිරේක ලකුණු 03 හිමිවේ.)

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස (සා.පෙළ) විභාගය හා අ.පො.ස (උ.පෙළ) විභාගය පවත්වන පාසල් සඳහා
} (ලබාගත් ලකුණු) +06

(අදාළ කාලසීමාව තුළ විදුහලේ විදුහල්පති තනතුරේ සේවය කර ඇත්නම් පමණක් අතිරේක ලකුණු 06 හිමිවේ.)

(06.3) විෂය බාහිර/ විෂය සමගාමී ජයග්‍රහණ සඳහා ලබා දී ඇති දායකත්වය (උපරිම ලකුණු 10)

(06.3.අ) අදාළ අයදුම්කරුගේ නායකත්වය යටතේ පාසල සඳහා අත් කර දී ඇති සුවිශේෂ ජයග්‍රහණ සලකා බලා මෙම ලකුණු ප්‍රදානය කළ යුතු වේ.අයදුම්කරු සේවය කරන ලද පාසල් වල ආසන්න වසර 3ක කාලය තුළ ලබා ඇති සෞන්දර්ය, ක්‍රීඩා සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් වෙනත් විෂය සමගාමී ජයග්‍රහණ සලකා බැලිය යුතු අතර මෙම ජයග්‍රහණ අධ්‍යාපන අමාත්‍යාංශය/ අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ රජයේ අමාත්‍යාංශයක්/ දෙපාර්තමේන්තුවක් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ආයතනයක් මගින් මෙහෙයවන හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව සහභාගී වන තරගයක දී/ තරගාවලියක දී ලද ජයග්‍රහණයක් විය යුතුයි.

මෙම ලකුණු ප්‍රදානය කිරීමේ දී එක් ඉසව්වක් සඳහා ලබා ඇති උපරිම ජයග්‍රහණය සඳහා එක් මට්ටමක දී පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.පහත සඳහන් මට්ටම් වලදී ජයග්‍රහණ 2 කට පමණක් ලකුණු ලබා දේ.

ජාත්‍යන්තර ජයග්‍රහණ	-	ලකුණු 05
ජාත්‍යන්තර නියෝජනය	-	ලකුණු 04
ජාතික / සමස්ත ලංකා ජයග්‍රහණ	-	ලකුණු 03
පළාත් ජයග්‍රහණ	-	ලකුණු 02
කලාප ජයග්‍රහණ	-	ලකුණු 01

(06.3.ආ) විද්‍යාලය තුළ සක්‍රීයව ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් විෂය බාහිර ක්‍රියාකාරකම් වලින් ඕනෑම 02ක් සඳහා ලකුණු 01ක් පිරිනැමේ.(ඒ බව කොටඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් තහවුරු කර ඉදිරිපත් කල යුතුයි.)

ශාන්ත ජෝන් ගිලන් රථ සේවය /පෝතක බාලදක්ෂ /වෙස්/ කරාතේ/ පරිසර හිට

- **(06.3.ආ) අදාළ වන්නේ ප්‍රාථමික පාසල් සඳහා පමණි.**

(06.4) විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් පද්ධතිය වෙත අත් කර දී ඇති නිර්මාණශීලී ප්‍රතිඵල (උපරිම ලකුණු 08)

තම සේවා කාලය තුළ ආසන්න වසර 3 කදී ක්‍රියාත්මක කර ඇති විශේෂ වැඩසටහන්/ ව්‍යාපෘති සඳහා මෙම ලකුණු ලබා දෙනු ලැබේ. අයදුම්කරු විසින් ම ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, මෙම ව්‍යාපෘති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව තිබිය යුතු අතර අදාළ විෂය භාර අධ්‍යක්ෂ/ කොටඨාස අධ්‍යක්ෂ/ කලාප අධ්‍යක්ෂ හෝ අදාළ බලධාරියා විසින් අනුමත කර , එම ව්‍යාපෘති ක්‍රියාත්මක වූ බවට ද තහවුරු කර තිබිය යුතුය.

එක් විශේෂ ව්‍යාපෘතියක් / වැඩසටහනක් සඳහා ලකුණු 2 බැගින් උපරිම ලකුණු 08කි.

- ප්‍රතිඵල සංවර්ධනය /විෂය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- ඌණ සම්පත් කළමනාකරණය / භෞතික සම්පත් වර්ධනය සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්
- මානව සම්පත් සංවර්ධනය/ ප්‍රජාවේ සුබ සිද්ධිය සඳහා ක්‍රියාත්මක කර ඇති සුවිශේෂ වැඩසටහන්
- පරිසර වැඩසටහන්/ සාමාජීය වැඩසටහන්
- වෙනත් විශේෂ නිර්මාණශීලී ක්‍රියාකාරකම්

(06.5) ජ්‍යෙෂ්ඨතාවය (උපරිම ලකුණු 06)

විදුහල්පති සේවයේ සේවා කාලය වසර 1කට ලකුණු 1 බැගින් උපරිම කාලය වසර 06 ක් සඳහා ලකුණු ලබා දිය යුතුයි.

පුරප්පාඩු සහිත පාසල සඳහා අනුමත විදුහල්පති ශ්‍රේණියට අදාළව මෙම ලකුණු ප්‍රදානය කළ යුතුයි. එහිදී ජ්‍යෙෂ්ඨතාවය සඳහා හිමි ලකුණු ප්‍රදානය කරනු ලබන්නේ අයදුම්කරු තමා අයදුම් කරන පාසලට අනුමත විදුහල්පති ශ්‍රේණිධාරියෙකු නම් පමණි.

(උදා-: 1AB පාසලක් සඳහා අයදුම් කරන විදුහල්පතිවරුන්ට ජ්‍යෙෂ්ඨතාවයට හිමි ලකුණු ලබා දිය යුතු වන්නේ විදුහල්පති 1 ශ්‍රේණියේ සේවා කාලය සම්පූර්ණ කර ඇති වසර ගණන සඳහා පමණි. 11 හා 111 ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් ද අයදුම් කර ඇත්නම් මෙම ලකුණු හිමි නොවේ.)

(06.6) දුෂ්කර සේවා කාලය. (උපරිම ලකුණු 04)

විදුහල්පති ශ්‍රේණියට පත්වීමෙන් අනතුරුව අති දුෂ්කර,දුෂ්කර,ප්‍රියමනාප නොවන පාසලක වසර 03 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පහත පරිදි ලකුණු ලබා දේ.

අති දුෂ්කර	- ලකුණු 04
දුෂ්කර	- ලකුණු 03
ප්‍රියමනාප නොවන	- ලකුණු 02

(06.7) සේවය සඳහා ලබා ඇති ඇගයීම්. (උපරිම ලකුණු 06)

විදුහල්පති ශ්‍රේණියට පත්වීමෙන් පසු ආසන්න වසර 3ක් තුළ දී ලබා ඇති සේවා ඇගයීම් සඳහා ලකුණු ප්‍රදානය කළ යුතුයි. මෙහිදී එකම කාරණයකට ලබාදී ඇති ඉහළම ප්‍රශංසා මට්ටමට ලකුණු හිමි වේ.

උපරිම ලකුණු 6ට යටත්ව ඇගයීම් අවස්ථා කීපයක් සඳහා ලකුණු ප්‍රදානය කළ හැකිය.

අනු අංකය	ලබා ඇති ඇගයීම්	උපරිම ලකුණු
01	ගුරු විදුහල්පති ප්‍රතිභා ප්‍රණාම/ජාතික මට්ටමේ ඇගයීම්/ඵලදායීතාව	04
02	පළාත් මට්ටමේ ඇගයීම්	03
03	කලාප ඇගයීම්	02
04	පොදු 230 බී ආකෘතියේ ලබා දී ඇති සේවා ප්‍රශංසා	02

(06.8) ලබා නොගත් නිවාඩු. (උපරිම ලකුණු 05)

මේ සඳහා ආසන්න වසර 3ක කාලය තුළ ලබා නොගත් නිවාඩු සලකා බලනු ලබන අතර වසර 3හිම සාමාන්‍ය සලකා ලකුණු ලබා දිය යුතුයි.

වර්ෂයක දී ලබා නොගත් නිවාඩු ;

අනු අංකය	ලබා නොගත් නිවාඩු ගණන	උපරිම ලකුණු
01	35ට වැඩි	05
02	31 – 35 අතර	04
03	25 - 30 අතර	03
04	20– 24 අතර	02

(06.9) .සේවා පළපුරුද්ද. (උපරිම ලකුණු 10)

විදුහල්පතිවරයෙකු /නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු/ සහකාර විදුහල්පතිවරයෙකු ලෙස සේවය කර ඇති කාලය උපරිම වසර 5ක් සඳහා ලකුණු ලබාදිය යුතුයි.උපරිම වසර 5ට යටත් ව විදුහල්පතිවරයෙකු /නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු/ සහකාර විදුහල්පතිවරයෙකු යන තනතුරු දරා ඇති මුළු කාලසීමාව මේ සඳහා සලකා බැලිය හැකිය.

අනු අංකය	සේවා පළපුරුද්ද	උපරිම ලකුණු
01	විදුහල්පතිවරයෙකු ලෙස සේවය කර ඇති කාලය (වසර 1ට ලකුණු 2 බැගින්)	10
02	නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු/ සහකාර විදුහල්පතිවරයෙකු ලෙස සේවය කර ඇති කාලය (වසර 1ට ලකුණු 1 බැගින්)	05

(06.10) නායකත්ව හා පෞරුෂත්ව ගුණාංග (උපරිම ලකුණු 06)

(අ). නායකත්වය හා කළමනාකරණ හැකියාව (උපරිම ලකුණු 03)

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව සඳහා වූ ඇගයීම් ක්‍රියාවලියෙහි නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රය සඳහා ලබා ඇති ලකුණු ප්‍රතිශතය (ආසන්න වසර 3ක කාලය තුළ ලබා ඇති ලකුණු ප්‍රතිශතයේ සාමාන්‍ය අගය) අනුව මෙම ලකුණු ප්‍රදානය කළ යුතුයි.

අනු අංකය	නායකත්වය හා කළමනාකරණය ඇගයීම් ක්ෂේත්‍රය සඳහා ලබා ඇති ලකුණු ප්‍රතිශතය	ලකුණු
01	ලකුණු 80% ට වැඩි	03
02	ලකුණු 70% - 79% අතර	02
03	ලකුණු 60% - 69% අතර	01

(ආ). පෞරුෂත්ව ගුණාංග (උපරිම ලකුණු 03)

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ සන්නිවේදන හැකියාව, ගැටලු විශ්ලේෂණය, අන්තර් පුද්ගල සම්බන්ධතා ආදී පෞරුෂත්ව ලක්ෂණ සලකා මෙම ලකුණු ප්‍රදානය කළ යුතුයි.

සටහන - 4

- ඉහත 06.01 සිට 06.10 දක්වා නිර්ණායකයන් සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 100 කි.

සටහන - 5

- විදුහල්පති සේවයේ තනතුරක සිට සක්‍රීය සේවයේ තනතුරක් සඳහා මුදා හරින ලද නිලධාරියෙකුට ලකුණු පිරිනැමීමේදී , අංක 06 ලකුණු ලබා දීමේ ක්‍රමවේදය යටතේ "පූර්වාසන්න වසර 03 ක කාලය " වෙනුවට "විදුහල්පති සේවයේ තනතුරක පාසලෙහි සේවය කල පූර්වාසන්න වසර 03 ක කාලය " යන්න අදාළ කරගත යුතුය.

විසඳ දීපාපුර් සභාවේ
අංක ... දරණ
... ගැටලු ...
... ගරු ... සභාපතුමා විසින්
... වඩ සහතික කරමි.
වයඹ ආණ්ඩුකාරවරු ලේකම්
දිනය: 2016.05.16

<u>07 . දඬුවම් හා දෝෂ දර්ශන සඳහා ලකුණු අඩු කිරීම.</u>

අයදුම්කරු විදුහල්පති සේවයට පත්වීමෙන් අනතුරුව සම්පූර්ණ සේවා කාලය තුළ දෝෂ දර්ශනවලට හෝ විනය නියෝගවලට ලක් වී ඇත්නම්, ඒ සඳහා උපයා ගත් ලකුණුවලින් ලකුණු 5ක් අඩු කරනු ලැබේ. මෙහි දී වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහයේ උපලේඛන 1 යටතේ වරදකට භාජනය වී ඇත්නම් හෝ පොදු 230 බී ආකෘතියෙන් ලබා දී ඇති දෝෂ දර්ශනයක් සඳහා මෙම ලකුණු 5 අඩු කරනු ලැබේ. එහිදී එක් අවස්ථාවකට ලකුණු 05 බැගින් අඩු කරනු ලැබේ.

08. නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුරු දරන අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීම.

මෙම පරිපාටියට අනුව නියෝජ්‍ය විදුහල්පති සහ සහකාර විදුහල්පති තනතුරු දරන අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීමේ දී 6.2 හා 6.3 සඳහා හිමි සම්පූර්ණ ලකුණුවලින් 75% ක ප්‍රතිශතයක් පමණක් ලබා දෙනු ලැබේ.

09. අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවූ අවස්ථාවක ගන්නා ක්‍රියාමාර්ග.

1. යම් පුරප්පාඩු සහිත පාසලක් සඳහා අදාළ ශ්‍රේණියට අනුව සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති නම්, ඊළඟ ශ්‍රේණියේ අයදුම්කරුවන්ගෙන් එම පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

2. යම් පාසලක් සඳහා කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවන අවස්ථාවක දී කාර්ය සාධනය සැලකිල්ලට ගෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත පළාත් අධ්‍යාපන ලේකම් විසින් සුදුසු විදුහල්පතිවරයෙකු ස්ථානගත කරනු ලැබේ.

10. පත් කිරීමේ කොන්දේසි

1.සම්මුඛ පරීක්ෂණය මගින් තෝරාගන්නා ලද විදුහල්පති ශ්‍රේණිධාරීන් වැඩ භාරගත් දිනයේ සිට අවම වශයෙන් වසර 03 ක කාලයක් අදාළ පත්කරන ලද පාසලේ සේවයේ යෙදිය යුතුය.එසේ වුවද සේවා අවශ්‍යතාවය මත වයඹ පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතියට යටත්ව ඉහත කොන්දේසිය නොතකා ඉල්ලුම් පත්‍ර කැඳවිය හැකිය.

2.මූලික විමර්ශන නිර්දේශයන් හෝ විනය නියෝගයක් අනුව ලබාදී ඇති ස්ථාන මාරු සඳහා මෙම පටිපාටිය අනුව සිදුකරනු ලබන ස්ථාන ගත කිරීම් මඟින් බලපෑමක් සිදු නොවිය යුතුයි.

කමිටු නිර්දේශය.

❖ වයඹ පළාත් සභා පාසල්වල පුරප්පාඩු සඳහා විදුහල්පතිවරුන් ස්ථානගත කිරීමේ සංශෝධිත පටිපාටිය නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමු.

නම

අත්සන

01. ඩබ්.එම්.සී.කේ.වන්නිනායක මයා
ලේකම්
වයඹ ප්‍රධාන අමාත්‍යාංශය

.....

02. අජන්ත ගුණවර්ධන මයා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
වයඹ ප්‍රධාන අමාත්‍යාංශය

.....

03. කේ.එම්.එස්.එස්.කුමාරි මිය
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
කුරුණෑගල

.....

වයඹ පළාත් සභාවේ
අංක ..... දරණ
ලැබුණා බවත් හඳුන්වා දී
පත්වීම් අනුයාත විදුහල්පති ලේඛනයේ
-කාලීන් ඇතුළත් කිරීම සඳහා
කරු ... මහතුමා විසින්
2026/5/6 දින අනුමත කරන ලද
බව සහතික කරමි.
වයඹ ආණ්ඩුකාරවරු ලේකම්
දිනය: 2026/05/06.

කේ.එම්.එස්.එස්. කුමාරි
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන)
වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
කුරුණෑගල.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

වයඹ පළාත් පාසල්වල පුරප්පාඩු සඳහා විදුහල්පති ශ්‍රේණිධාරින් ස්ථානගත කිරීමේ අයදුම්පත්‍රය

01. නිලධාරියා පිළිබඳ විස්තර

1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :- .....මයා/මිය/මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- Mr/Ms/Mrs .....

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- .....

.....

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය :-

ස්ත්‍රී -F පුරුෂ - M (අදාළ සංකේතය කොටුව තුල සඳහන් කරන්න)

1.5 උපන් දිනය :- වර්ෂය :- ..... මාසය :- ..... දිනය :- .....

1.6 අයදුම්පත් කැඳවන දිනට වයස :- අවු. :- ..... මාස :- ..... දින :- .....

1.7 ජාතික හැඳුනුම්පත් අංකය :-

1.8 රාජකාරී ලිපිනය :- .....

1.9 ස්ථිර පදිංචි ලිපිනය :- .....

1.10 දුරකථන අංකය :- ..... whatsapp අංකය :- .....

02. සේවා විස්තර

2.1 ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වූ දිනය :- .....

2.2 වර්තමාන ශ්‍රේණිය :- .....

2.3 එම ශ්‍රේණියට උසස් වූ දිනය :- .....

2.4 වර්තමාන තනතුර සහ පාසල :- .....

2.5 වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කල දිනය :- .....

03. අධ්‍යාපන සුදුසුකම්

ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම	ආයතනය	වලංගු වන දිනය

04. වෘත්තීය සුදුසුකම්

ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම	ආයතනය	වලංගු වන දිනය

05. දේශීය හෝ විදේශීය වෙනත් පුහුණු (දින 03/ පැය 24 හෝ ඊට වැඩි පුහුණු)

පුහුණු පාඨමාලාව	ආයතනය	කාල සීමාව

06. පාසලේ විභාග ප්‍රතිඵල

(පුර්වාසන්න වසර 03 ක තමා සේවය කරන ලද පාසලට අදාළව මෙම කොටස සම්පූර්ණ කරන්න.)

6.1. ශිෂ්‍යත්ව විභාගය

වර්ෂය	පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	ලකුණු 130 ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව	ලකුණු 100 ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව	ලකුණු 70 ට වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව	ලකුණු 70 ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාව

6.2. අ.පො.ස (සා.පෙළ) විභාගය

වර්ෂය	සමත් ප්‍රතිශතය

6.3. අ.පො.ස (උ.පෙළ) විභාගය

වර්ෂය	සමත් ප්‍රතිශතය

07. විෂය බාහිර/විෂය සමගාමී ජයග්‍රහණ සඳහා ලබා දී ඇති දායකත්වය

(තමා සේවය කර ඇති පාසල්වලට අදාළව පූර්වාසන්න වසර 03 ක කාලය තුල පාසලට හිමිව ඇති ඉහළම මට්ටමේ ජයග්‍රහණ දෙක පමණක් ඇතුලත් කරන්න.)

	තරඟ මට්ටම	තරඟකරුගේ නම	තරඟාවලිය	ඉසව්ව/තරඟ අංශය	ස්ථානය	වර්ෂය
1						
2						

08. සේවය සඳහා ලබා ඇති ඇගයීම්

ලබා ඇති ඇගයීම්	කලාප/ පළාත්/ ජාතික මට්ටම	ඇගයුමට අදාළ වර්ෂය

09.ලබා නොගත් නිවාඩු (පූර්වාසන්න වසර තුනක නිවාඩු විස්තර ඇතුලත් කරන්න.)

වර්ෂය	ලබා නොගත් නිවාඩු සංඛ්‍යාව

10. දුෂ්කර සේවා කාලය

(විදුහල්පති සේවයට පත්වීමෙන් අනතුරුව අති දුෂ්කර/දුෂ්කර/ප්‍රියමනාප නොවන පාසල්වල සේවා කාලය පිළිබඳ තොරතුරු ඇතුලත් කරන්න.

පාසලේ නම	වර්ගය (අති දුෂ්කර/දුෂ්කර/ප්‍රියමනාප)	තනතුර	සේවය කල කාලසීමාව

11. පූර්ව සේවා විස්තරය (ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වූ දින සිට)

පාසල	කාල සීමාව		දරන ලද තනතුර
	දින සිට	දින දක්වා	

12. දඬුවම් හා දෝෂ දර්ශන :-

විදුහල්පති සේවයට පත්වීමෙන් අනතුරුව පොදු 230 බී ආකෘතියෙන් ඔබ වෙත නිකුත් කර ඇති දෝෂ දර්ශන හා වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහයේ උපලේඛන I හි සඳහන් වරදකට අදාලව නිකුත් කර ඇති විනය නියෝග සම්බන්ධයෙන් තොරතුරු මෙහි ඇතුලත් කරන්න.

දෝෂ දර්ශන/විනය නියෝගය නිකුත් කල දිනය	විස්තරය

13. ඉල්ලුම් කරන තනතුරු :- (ඔබගේ මනාපය අනුපිළිවෙලට සඳහන් කරන්න.)

අනු අංකය	තනතුර	පාසල

14. අයදුම්කරුගේ සහතිකය :-

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් , මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වන බවත් ප්‍රකාශ කර සිටිමි.

....

දිනය අයදුම්කරුගේ අත්සන

15. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය :-

I. ඉහත තොරතුරු සඳහන් ..... මයා/මිය/මෙනවිය ..... පාසලේ සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරියෙකු/නිලධාරිනියක බවත් ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි.

II. මෙම අයදුම්කරු විදුහල්පති සේවයට පත්වීමෙන් අනතුරුව සම්පූර්ණ සේවා කාලය තුළම පොදු 230 බී ආකෘතියෙන් ලබා ඇති දෝෂ දර්ශන හෝ විනය නියෝග වලට ලක්වී ඇති/ නැති බවත්,පූර්වාසන්න වසර 05 තුල විනය ක්‍රියාමාර්ගයකට භාජනය වී ඇති/නැති බවත් සහතික කරමි.

III. ඉහත නම් සඳහන් නිලධාරියාගේ/නිලධාරිනියගේ ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව/පසුව ලබා දීමේ පදනම මත නිර්දේශ කරමි/නොකරමි.

....

දිනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන

16. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :-

ඉහත නම් සඳහන් නිලධාරියාගේ/නිලධාරිනියගේ ඉල්ලීම නිර්දේශ කරමි/නොකරමි.

....

දිනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන